# රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සිංහල ශබ්දකෝෂ කාර්යාලයේ ප්‍රධාන කර්තෘ තනතුර සහ සිංහල විශ්වකෝෂ කාර්යාලයේ ප්‍රධාන කර්තෘ තනතුර සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම

01. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- සිංහල ශබ්දකෝෂ කාර්යාලයේ ප්‍රධාන කර්තෘ තනතුර
- සිංහල විශ්වකෝෂ කාර්යාලයේ ප්‍රධාන කර්තෘ තනතුර

02. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025.03.28 දින හෝ ඊට පෙර ලැබෙන සේ **සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතියට අනුව A4 (8.27 x 11.69) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර අයදුම්පත් එවිය යුතු ය.

04. මෙම තනතුරු සඳහා අයදුම්පත්‍ර එවීමේ දී අයදුම් කරනු ලබන තනතුර අයදුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලි ව සඳහන් කර එවිය යුතු ය.

05. අයදුම්පත්‍ර පිරවීමේ දී අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර නිවැරදිව ඇතුළත් කළ යුතු ය.

06. සේවයේ නියුක්ත කරවීම හා සේවා කොන්දේසි :

- වැටුප : රු.50,000/= ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

- මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත ඇති කළ තනතුරක් වන අතර ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරින්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි. මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන්නේ එක් වර්ෂයක කොන්ත්‍රාත් කාලයක් සඳහා පමණි.

07. *සුදුසුකම් :*

7.1 අධ්‍යාපන සුදුසුකම් :-

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ආචාර්ය උපාධියක් ලබා තිබීම.

7.2 වෘත්තීය සුදුසුකම් :- අදාළ නොවේ.

7.3 පළපුරුද්ද :-

01. (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, මහාචාර්ය හෝ සහාය මහාචාර්ය තනතුරක අවම වශයෙන් අවුරුදු 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ;

*හෝ*

(ii) කෝෂ ග්‍රන්ථ කාර්යාලයක කර්තෘ තනතුරේ අවම වශයෙන් වසර 05 ක අඛණ්ඩ හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

02. ඉංග්‍රීසි භාෂාව හා පාලි, සංස්කෘතික භාෂා පිළිබඳව ප්‍රවීණ දැනුමක් ලබා තිබීම. (ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී වාචිකව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ ලිඛිත දැනුම පරීක්ෂා කර බලනු ලැබේ.)

7.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

7.5 වෙනත් සුදුසුකම් :

1. සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතු ය.
2. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
3. තනතුරට බඳවා ගැනීම සඳහා 7.1 හි සිට 08 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /*ගැසට් පත්‍රයේ* සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

08. ***වයස :*** අවුරුදු 60 ට වැඩි සහ 72 ට නොවැඩි විය යුතු ය.

09. බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ම සුදුසුකම් ද පරීක්ෂා කර බලනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 | අදාළ නොවේ |
| පළපුරුද්ද | 30 | |
| කෝෂ ග්‍රන්ථ කාර්යාලයක සේවා කාලය | 10 | |
| අතිරේක භාෂා දැනුම | 15 | |
| මුද්‍රණ ශිල්පය පිළිබඳ දැනුම | 15 | |
| කර්තෘත්වයෙන් ප්‍රකාශිත ශාස්ත්‍රීය ග්‍රන්ථ | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ලේකම්,
බුද්ධ ශාසන , ආගමික හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.